**වර්ෂ 2022 සැප්තැම්බර් මස 20 වන දින පෙ.ව. 10.00 ට පවත්වන්නට යෙදුනු කුරුවිට ප්‍රාදේශීය සභාවේ විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව :-**

- **සභාපතිතුමා මූලසුන ගැනිම** :- ගරු සභාපතිතුමා විසින් පැමිණි සිටි සියළු දෙනා පිලිගන්නා ලද අතර පෙ.ව.10.00 ට විශේෂ සභා කටයුතු ආරම්භ විය.

පැමිණිම - මෙදින රැස්වීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රිතුමන්ලා සහ ගරු මන්ත්‍රිතුමියන්ලා සහභාගි විය.

| අනු.අ | තනතුර | පක්ෂය | නම | පැමිණිම |
|---|---|---|---|---|
| 1. | ගරු සභාපති | ශ්‍රී.ල.පො.පෙ | ප්‍රේමරත්න මල්කැකුල මහතා | පෙ.ව. 09.00 |
| 2. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ප්‍රේමා ගම්ලත් මිය | පෙ.ව. 09.05 |
| 3. | ගරු ප්‍රාසම | ජ.වි.පෙ | ජී.ඒ.ජයසිංහ මහතා | පෙ.ව. 09.40 |
| 4. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ආර් .සෝමරත්න මහතා | පෙ.ව. 09.59 |
| 5. | ගරු ප්‍රාසම | ජ.වි.පෙ | එම්.ඩබ්.විකසිත පුෂ්පසූරිය මහතා | පෙ.ව. 09.59 |
| 6. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.ඒ.මහින්ද විජේකුමාර මහතා | පෙ.ව. 09.59 |
| 7. | ගරු ප්‍රාසම | එ.ජා.ප. | එච්.එම්.සී.එස්.ධනවර්ධන මහතා | පෙ.ව. 09.59 |
| 8. | ගරු ප්‍රාසම | එ.ජා.ප. | එම්.කේ. විජේසිරි මහතා | පෙ.ව. 10.00 |
| 9. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ජී.එම්. ජයරත්න මහතා | පෙ.ව. 10.00 |
| 10. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.පී.තරංග නිල්මිණි මහතා | පෙ.ව. 10.10 |
| 11. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.ඩබ්.එස්.සම්පත් බොතේජු මහතා | පෙ.ව. 10.10 |
| 12. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කේ.ඒ.අසංක දිල්ෂාන් මහතා | පෙ.ව. 10.10 |
| 13. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කැළුම් ශ්‍රී ධර්මදාස මහතා | පෙ.ව. 10.10 |
| 14. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.දීප්ති චන්දන විජේසිරි මහතා | පෙ.ව. 10.10 |
| 15. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | මාලනී පීරිස් මිය | පෙ.ව. 10.10 |
| 16. | ගරු ප්‍රාසම | ශ්‍රී .ල.පො.පෙ | ජීවන් රණතුංගමහතා | පෙ.ව. 10.10 |
| 17. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ඩබ්.එම්.මදුෂාණි වීරසිංහ මිය | පෙ.ව. 10.10 |
| 18. | ගරු ප්‍රාසම | එ.ජා.ප | ඉන්ද්‍රානි වික්‍රමසිංහ | පෙ.ව. 10.10 |
| 19. | ගරු ප්‍රාසම | එ.ජා.ප | චන්ද්‍රලතා බණ්ඩාර මිය | පෙ.ව. 10.15 |
| 20. | ගරු උපසභාපති | ශ්‍රී.ල.පො.පෙ | ඒ.ජේ.අනිල් ලියනගේ මහතා | පෙ.ව. 10.20 |
| 21. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | මංගල කිත්සිරි ඩයස් මහතා | පෙ.ව. 10.21 |
| 22. | ගරු ප්‍රාසම | එ.ජා.ප. | කේ.එල්.එම්.ඩී.කරදන මිය | පෙ.ව. 10.21 |
| 23. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | රුවන් අශෝක පතිරණ මහතා | පෙ.ව. 10.21 |
| 24. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ආර්.ඩිලාන් දර්ශන රණසිංහ මහතා | පෙ.ව. 10.45 |
| 25. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ජී.ඩබ්.ජනක විමලසිරි මහතා | පෙ.ව. 10.50 |
| 26. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එම්.ජී.ධනංජය වීරසේකර මහතා | පෙ.ව. 10.51 |
| 27. | ගරු ප්‍රාසම | එ.ජා.ප. | එම්.ඒ.දේවින්ද කුමාර මහතා | පෙ.ව. 10.52 |
| 28. | ගරු ප්‍රාසම | එ.ජා.ප. | ජී.ආ්.ඒ.රනිල් එදිරිසිංහ මහතා | පෙ.ව. 11.50 |

- **ආගම සිහිකිරීම.** :- සියළු දෙනා සමඟ ආගම සිහිකරන ලදී.

01- යථා පරිදි කල්දී ඇති යෝජනා.

01-01 **කුරුවිට ප්‍රාදේශීය සභාවේ2023 වර්ෂයේ අයවැය කෙටුම්පත සඳහා විශේෂ** මහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-**
**කුරුවිට ප්‍රාදේශීය සභාවේ2023 වර්ෂයේ අයවැය කෙටුම්පත සඳහා සංශෝධනයන්ට යටත්ව විශේෂ** මහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා-
එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-**
තවදුරටත් අයවැය කෙටුම්පත සඳහා ඇතුලත් විය යුතු යෝජනා පිලිබඳ තොරතුරු දෙන්න. මේවන විට අපි සභාවක් ලෙස විශාල වැඩ කොටසක් ඉටු කලා.2021 ජූලි සිට මුද්දර ගාස්තු අපට ලැබෙන්න තියෙනවා.එසේම අවිස්සාවේල්ල කොළඹත් තියෙනවා.ඉදිරි කටයුතු කරන්න වෙන්නේ මේ මුදල් වලින්.ඉදිරි මාස දෙක තුන ඇතුලත මේ මුදල් ගන්න ඕනි.අයවැය යෝජනා තමා ක්‍රියාත්මක වෙන්නේ.ඒ නිසා අවශ්‍ය සංශෝධන මේ අවස්ථාවේ දෙන්න. තවදුරටත් විෂය නිලධාරියාටත් ලිඛිතවත් සංශෝධන දෙන්න.ඒවා ඇතුලත් කරන්නපුළුවන්.අද සාකච්ජා කරමු තව දුරටත්.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා-

සියළු කොට්ඨාශවල ඇති සුසානභූමිවලවටා වැටක් ඉදිකල යුතුයි.අනවසරයෙන් මිනිස්සු අල්ලගෙන.දෙල්ගමුව,දකුනු කඳංගොඩ නිරාකරනය කලා.කම්බිගහලා. ඒවගේ **කුරුවිටප්‍රාදේශීය සභාවේ_සියළු සුසානභූමිවල ආරක්ෂාව සඳහා කම්බි වැටක් ගැසීමට** යෝජනා කරමි.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කැළුම් ධර්මශ්‍රී මහතා-
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා-

කඳංගොඩ සුසාන භූමි කටයුතු වෙනුවෙන් නඩු කියන්නත් උනා.ගමේ පිරිසත් එකතුවෙලා වියදම් කලා.ලක්ෂයක් විතර වියදම් උනා.ඒ වගේ අනිත් සුසානභූමි වලටත් වෙයි.ඒ නිසා මේ කටයුත්ත කරන්න.ගේට්ටුවක් දාලා කම්බි ගහන්න.මිනියක් දාන්නතැනක් නැතුව යනවා.මේ විධිහට ඉඩම් අල්ලා ගත්තාම.දෙල්ගමුවටත් මේ අනවසර අල්ලාගැනීම බලපාලා.පිරිස දාලා සුද්ධ කරලා දෙන්න. ඒකත් අවශ්‍යයි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කැළුම් ධර්මශ්‍රී මහතා-
**සුසානභූමිවල අයිතිය අපිටද? ප්‍රාදේශිය ලේකම්ටද?අපෙත් සුසානභූමිය වටේ අල්ලගෙන.ගැටළු. රජයේ වෙන්කල සුසානභූමියට ඔප්පු දීලාද බලන්න ඕනි.අවධානය යොමු කරලා සුසානභූමිය අපිටගන්න.නිරවුල් කරලා.**

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ශ්‍රී ඉන්ද්‍රාණි වික්‍රමසිංහ මිය-</u>

**අපිටත් ඒ ගැටළුව ආවා.ගමේ සුසාන භූමියට අතින් වියදම්කරලා නඩු දාලයි විසඳාගත්තේ.කම්බිගහලා දෙන්න.**

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ශ්‍රී මාලනී පීරිස් මිය-</u>

**දරිද්‍රතාවය පිටුදැකිමට ගොවිතැන් කටයුතුවලට සුසානභූමිවල යම් ඉඩක් ලබාදීම සිදුකෙරෙනවා. මහඇල ප්‍රජාශාලාව අසල සුසානභූමිය කොටසක්.ඒකට මැදිහත් වෙන්න. ගමේ අය අකැමැති නෑ.මේ අවස්ථාවේ රටේ කෘෂිකර්මාන්තය දියුණු කල යුතුයි.නමුත් මේ ගැන සොයා බලන්න.මගේ වසමේ 4ක් තියෙනවා.හිස් ඉඩම්ලෙස තියෙනවිට ගැටළු වැඩියි. වටේ කම්බි ගහලා නිරවුල් කරන්න.එසේම අලංකරනයත් කල හැකියි.**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා-

රජයේ වගා නොකල ඉඩම් වැඩියි.පොහොරබාව කසල අංගනයෙන අක්කර 5 නවත් වගා කරවන්න.පදනමක් හදාගෙන දෙමු.බදු ආදායම් වගේ ගමු. ක්‍රමවේද හදන්න.පොහොරබාව තිප්පලහේන සුසානභූමියත් තියෙනවා.මියනදෙනිය පුද්ගලික. ජනශූන්‍යයි.ඒක සාකච්චාකරලා නිරවුල් කරලා ගන්නපුළුවන්.සභාවට ආදායම් එන දේ කොපමන ඉදිරිපත්කලත් ඒවා ක්‍රියාත්මක වීම මන්දගාමියි.හැම මන්ත්‍රිවරයාම මේවා ඉදිරිපත්කලත් ක්‍රියාත්මක කිරිම අඩුයි. ආයම් ලැබෙන කලහැකි දේ කරන්න.විශාල ආදායම් එන මාර්ග ඇන හිටලා.මස්කඩ/මාළුකඩ/බදු/ විතරක් නෙවේ.කසලඅංගනයෙන් ලොකු ආදායමක් ගන්න පුළුවන්.10 දෙනෙකුට විතර අක්කර බාගේ ගානේ විතර දෙමු.වගා කරන්න.ඒ වගෙමයි **පොහොරබාව දේවාල පාර අබලන් ඒකටත් යම්ප්‍රතිපාදනයක් දාලා සංවර්ධනය** කරන්න.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා-</u>

සුසානභූමිවල වටේ කොස්ගස්තියෙනවා.කපන්නබැරිඋනොත් නිසි කාලෙට දිරලා යනවා විතරයි.හැම සුසාන භූමිවලට වටේ වටින ගස් දැව තියෙනවා.කපලා වෙන්දේසි කරලා ඒමුදලින් ඒ වැට ගහන්නත් පුළුවන්.දෙල්ගම්වෙත් තියෙනවා.ගැලපෙන්නෑ ඒ ඉඩම්වලට එතරම් විශාල ගස්.ඒ ගස් අවහිරයි.නමුත් වගා කල එක හොඳයි.නැවත වගාකරන්නත් පුළුවන්.දෙල්ගමුවෙත් තියෙනවා.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සම්පත්බොතේජු මහතා-</u>
තලාවිටිය පොදු වැසිකිලිය අපිට අහිමි වෙලා.ඒක ප්‍රතිසංස්කරනයත් කරන්න.සොයා බලා කටයුතු කරන්න.
<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා-</u>

අපි කෙටුම්පත විශ්ලේෂනය කලා.මේ ඉලක්කම් ආ හැටි විස්තර කරන්න.ගියවර මනසින් මවාගෙන ඉලක්කම් දාලා ඒ ඉලක්ක වලට එන්න බැරිඋනා.ඒ යෝජනා ක්‍රියාත්මක කරන්නබැරිඋනා.

මේ අවස්ථාවේදි කෙටුම්පත විෂය නිලධාරි මගින් විග්‍රහකරගැනිම සඳහා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතාගේ සහ ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභාව කාරක සභාවක් බවට පත්විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසූරිය මහතා විසින් බලප්‍රදේශයේ **දැන්වීම් පුවරු සඳහා ලැබීමට නියමිත ආදායම අඩුවී ඇති බවත්** පසුගිය වර්ෂවලදි ඊට වැඩි ආදායමක් ලැබී ඇති බවත් පෙන්වා දුනි. නව දැන්වීම් පුවරු වලින් දැනුවත් කර තව දුරටත් මේ ආදායම නිශ්චිතවම වැඩිකරගත හැකි බව පෙන්වාදුනි.

ස්ථිර දැන්විම් පුවරුවලින් වර්ග අඩියට අයකරන ගාස්තුව වැඩිකිරිම තුලින්ද මෙම ආදායම වැඩිකිරිම පිලිබද ගරු සභාපතිතුමා විසින් අදහස් දක්වන ලදි.ඒ **අනුව වර්ගඅඩියට රු.150.00 බැගින් අයකිරිමට තීරනය විය.**
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතාඅදහස් දක්වමින් වටප්පිටිය මන්වී දැන්විම් පුවරු සවිකිරිමට පියවර ගත්බවත් තොරතුරුලබාදි මේවන විට ආදායම් අයකිරිමට පියවරගෙන ඇති බවත් දන්වන ලදි.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා විසින් 2019 සිට 2022 හා ඉදිරි 2023 දක්වාද සභාවේ ආදායම් පිලිබද තොරතුරු විශ්ලේෂනය කර දත්තපිලිබඳ ගැටළු නිරාකරනය කරමින් සාකච්ජා කරන ලදි.මෙහිදි තාවකාලික වරිපනම් තක්සේරුව හා ,ඉඩම් වෙන්දේසි වලින් ලබාගන්නා විකුනුම් මුදලෙන් 1% ක (තාවකාලික තක්සේරු මුදල )පිලිබඳව දිර්ග ලෙස සාකච්ජා කරන ලදි. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා කරුනු දක්වමින් පැරඩයිස් වෙන්දේසි ඉඩමේ මෙම තක්සේරුව පිලිබද යම් ගැටළු පවතින අතර ඒවා නිසිපරිදි සොයා බලා කටයුතු කිරිම අයකිරිම තුලින් සභාවට විශාල ආදායමක් ලබාගත හැකි බවට කරුනු දක්වන ලදි. එසේම තක්සේරු මුදලට වඩා විශාල මුදලකට ඉඩම් ලියන බවත් පෙන්වා දෙන ලදි.
සත්‍ය තක්සේරුව සෙවීම අත්‍යවශ්‍යබව දැක්වූ අතරලේකම්තුමිය විසින් අදහස් දක්වමින් වෙන්දේසිකරුවන් එකඟතාවයකට එළඹෙන බවත් ඔවුන් ගෙවිමට බැඳී සිටින බවත් දන්වන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසූරිය මහතාපැරඩයිස් වෙන්දේසි ඉඩමේ දළ තක්සේරුව පිලිබඳ ලිපිගොණු ගෙන්වා වැඩිදුරටත් කරුනු සොයාලබන ලදි.එක් එක් ලොට් සඳහා වන මුල ගනන ඉදිරිපත් කල අතර ඒවා ආදායම් පරිපාලක විසින් ලබා දී ඇති තක්සේරු මුදලට සමාන විය.
මෙහිදි ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා විසින් අදහස් දක්වමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් සත්‍ය තොරතුරු ලබාගත හැකි බවත් නිලධාරින් ඒ සඳහා යොමුකරන ලෙසත් දැනුම්දෙන ලදී.
ගරු උපසභාපතිතුමන් විසින් මෙමඉඩමේ වෙළඳප්‍රචාරක දැන්විම හි විශාල මුදලක් සඳහන් වන බවත් විශාල වත්කමක් එහි සඳහන් වුවද මෙසේ නිසි ආදායම සභාවට නොලැබෙන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසුරිය මහතා අදහස් දක්වමින් හැකි උපරිමයෙන් සභාවට ලැබියයුතු ආදායම නිවැරදිව ලබාගැනීමට කටයුතු කරන ලෙසත් වැඩි ආදායම් ඇති ස්ථානවලට ප්‍රමුඛත්වයදී අයකරගන්නා ලෙසද නිලධාරින් නිසිපරිදි මෙහෙයවා මෙමආදායම් අයකරගැනිමට කටයුතු නොකලහොත් බංකොලොත් වීම පවා සිදුවියහැකිබව අවධාරනය කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා විසින් අදහස් දක්වමින් පරකඩුව නිල්මිනි උයන සඳහා අවශය සභාවේන ලබාදිය යුතු පහසුකම් ලබාදි බදුත් නිසි ලෙස අයකරගැනීමට කටයුතු කරන ලෙසත් මෙම ලබාදියයුතු පහසුකම් නිසිලෙස ලබානොදිමෙන් ජනතා නියෝජිතයන්ද අසරන වන බවත් දන්වන ලදි.ඒ සඳහා වෙනම අරමුදලක් හෝ සකසන ලෙස දන්වන ලදී.දේශිය ආදියම් දෙපාර්තමේන්තුව සමග එක්ව් මෙම සභාවට නොලැබෙන ආදායම් ලබාගැනිමට අවශ්‍ය පියවර ගන්නා ලෙසද සාකච්ජා විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දීප්ති චන්දන මහතා අදහස් දක්වමින් විෂම කටයුතු සිදුනොවී ම සඳහා යම් ක්‍රමවේදයක් සැකසීම සුදුසු බව දන්වන ලදි.
ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 1% අයකරගත් බවත් ඔප්පුවට අදාල වටිනාකම ට අදාල ලිපිය ආපසු අනෙකුත් ඉදිරි අයකිරිම් සිදුවන බව දන්වන ලදි.එසේම පළාත් ආදායම් දෙපාර්තමේන්තුව ට දැනුම් දී සියළු වෙන්දේසි ඉඩම් වලට අදාල නිවැරදි තොරතුරු ලබාගෙන සභාවට අයවියයුතු ආදායම් අයකරගැනිමට කටයුතු සලසන ලෙස ලේකම්තුමියව දැනුවත් කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා විසින් හිඟ වරිපනම් අයකරගැනිම මන්දගාමි බවත් ඒවා කඩිනම් කරගතයුතු බවත් පෙන්වා දුනි.2019 වසරේ සිට හිඟ පැවතෙන බව පෙන්වා දුන් අතර මේවා අයකිරීමේ ක්‍රමවේද කඩිනම් කරන ලෙස දැනුම්දුනි.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් හි/කි ලෙස වරිපනම්ගෙවිමට සදහන්නොකර නම යොදනලෙස දැනුම්දුන් අතර තක්සේරු කටයුතු කරන අවස්ථාවේ අදාල අයිතිකරු ඉදිරිපත්නොවීමෙන් එසේ හිකි ලෙස යොමුකර ඇති බව ලේකම්තුමිය විසින් සඳහන් කරන ලදි.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් කරුනු දක්වමින් මේවන විට සභාවේ සේවකයින් විශාල ප්‍රමානයක් සිටින බැවින් මෙම හිඟ වරිපනම් අයකිරීමේ කටයුතුවල යෙදවිය හැකිබව පෙන්වා දෙන ලදී.සභාවේ වෙන්දේසිකලයුතු අබලිද්‍රවය ,දැව වෙන්දේසි කර ඇති බව ගරු සභාපතිතුමා දැනුම්දුන් අතර නාමල්දෙනිය ගිමන්හල ඉදිරි කටයුතු පිලිබඳවද ක්‍රමවේදයක් සැකසියයුතුබව දැනුම්දුනි.

අයවැය යෝජනා දුන්නද එම යෝජනා ක්‍රියාත්මක නොවි පසුව ක්‍රියාත්මක වන්නේ වෙනත් යෝජනා බවත් පරිපුරක පවා වෙනත් කටයුතු වලට යොදවා ඇති බැවින් යම් මූලය විනයක් පවත්වාගෙන යායුතු බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් පෙන්වා දෙන ලදී.සභාවේ බුදුමැදුර සඳහා දැරු වියදම් එසේ ගැටළු සහගත ගෙවීමක් බවත් පෙන්වා දෙන ලදි.
එම ගැටළුව නිරාකරනය කරඇතිබව ලේකම්තුමිය විසින් පෙන්වා දුනි.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා විසින් වැඩිදුරටත් අදහස් දක්වමින් සභාවට අයත් නාමල්දෙනිය ගිමන්හල සාර්ථකව සිදුකරගෙන යාමට නිතරම අවහිරතා මතුවීම, පුස්සැල්ල ආයුර්වේද ගොඩනැගිල්ල අසල ගොඩනැගිල්ල වෙළඳ කටයුතු අඩාල වීම,නගරයේ ඇතැම් ගොඩනැගිලි ජනාකීර්න නොවිම ආදි විද්‍යාත්මක නොවුවද යම් යම් හේතුමත එම තත්ව

ඇතිවිය හැකි බව පෙන්වා දෙන ලදි.ගරු සභාපතිතුමන් විසින් මෙහිදි අදහස් දක්වමින් වාස්තු දෝෂ හේතුවෙන් ද එවැනි තත්ව ඇතිවිය හැකිබවට සාකච්ඡාවිය.පනතේ කමිටුවකට හෝ ගොඩනැගිලි කමිටුවට හෝ යම් ආකාරයකින් බාහිර අයෙකු සම්බන්ධකරගෙන කටයුතු කලහැකි කමිටුවකට හෝ කිසියම්ක්‍රමවේදයකට වාස්තු කටයුතුපිලිබඳ දැනුම ඇති අයෙකු සම්බන්ධකර යම් ගෙවීමක් කරහෝ වාස්තු උපදෙස්ලබාගෙන සභාවේ ගොඩනැගිලි ඉදිකිරීමේදි උපදෙස් ගැනීමටත් විශේෂයෙන් නාමල්දෙනිය ගිමන්හලේ වාස්තු දෝෂ බැලීමටත් තීරනය විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා අදහස් දක්වමින් කාර්මික නිලධාරි විසින් ගනිතානුකූලව ඉදිකිරිම් සිදුකලද ඒවාට අනාය වූ පැරනි වාස්තු ක්‍රමවේද පවතින බවත් වර්තමානයේද එවැනි ප්‍රධාන ඉදිකිරිම් හේතුවෙන් එම ස්ථාන ජල ශුනා වි ඇති බවත් ප්‍රකාශ කලේය.එසේම ආහාර සුරක්ෂිතතාවය පිලිබඳ වැඩපිලිවෙලක අවශාතාවයද පෙන්වාදි ඒවා සභාවේද මෙහෙයවීම මත සිදුවියයුතු දෙයක් ලෙස පෙන්වා දෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා විසින්අදහස් දක්වමින් වරිපන්ම අක්කරබදු සඳහා ගෙනඇති පියවර විමසාසිටි අතර ඒවා සඳහා නඩු ගොනුකර අයකිරීම් කලහොත් ඒ පැහැරහැරිම් තවදුරටත් සිදු නොකරන බව පෙන්වා දෙන ලදි.දේපොල තහනම සිදුවන බව ලේකම්තුමිය ප්‍රකාශ කලාය.

උප සභාපතිතුමන් විසින් සභා ප්‍රදේශයේ වෙන්දේසි ඉඩම්වල පොදු කටයුතු සඳහා වෙන්කර ඇති ඉඩම්වල තත්වය විමසුවේය. ඒ අනුව එම පොදු කටයුතු ඉඩම් සන්තකය ලබාගැනිමට කෙතෙක් කටයුතු කර ඇද්ද යන්න විමසුවේය.සමහර ඉඩම් බාහිර පාර්ශව විසින් වගාකර ඇති බවත් ඒවා නිලධාරින් මෙහෙයවා  නිරවුල්කරගැනීමට කටයුතු කලයුතු බවත් දන්වන ලදී.ඒවා පොදු සුභසිද්ධියට ගැලපෙන ලෙස සංවර්ධනය කල යුතු බවත් දැනුම්දෙන ලදී.එසේම දිගු කාලයක් එම ඉඩම්වල පදිංචිව සිටීමෙන් එයද නීතිමය තත්වයකදි ගැටළු විය හැක.මෙම කරුනු කොර් අවධානය යොමු කර සභාව හි ආදායම් සංවර්ධනය කරගතයුතු බව දන්වන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩිලාන් රණසිංහ මහතා විසින්අදහස් දක්වමින් ලක්ෂ ගනන් ආදායම් ලබාගතහැකි ලෙස රජය ආයතන සතු ප්‍රජා පොදු භුමි,කෘෂි කටයුතු සඳහා තාවකාලිකව දීමෙන් උපයාගත හැකි බව පෙන්වා දෙන ලදී.

නෛතික තත්වයක් මත යම් මුදලකට අවු.05 කට පමන බදු දීමද වැදගත් බවත් නව චක්‍ර ලේඛය අනුව කනතු ද තාවකාලික වගා සඳහා ලබාදිය හැකි බවත් ඒවා ඉදිකිරිම් නොකර වසර 5 ට අඩු පල දරන තාවකාලික බෝග සඳහා ලබාදිමට හැකිබව ප්‍රකාශ කලේය.එවැනි ඉල්ලීම් පිලිබඳ සලකා බැලිය යුතුබවට ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා විසින් අයවැය කෙටුම්පතේ කෝටි 17 ආදායම් ලෙස පෙන්වුවද ඒවා සතා ලෙස එකතු වියයුතු බවත් 10 කට වැඩිය පුනරාවර්තන ඇතිබවත් මෙවැනි තත්ව මත සභාව විශාල අර්බුධයකට ආහැකි බවත් උදාහරන ලෙස බදු හිඟ වැනි තත්ව එන බවත් ඒ සඳහා දේපොල සන්තකයට රැගෙන නඩු දාන ලෙසත් එසේම සමහර අය ශීර්ෂ 2019 ටත් වඩා අඩු බවත් පෙන්වා දුනි.එසේම සභාවේ සැපයුම්කරුවන් සභාව සමග විශ්වාසය බිඳී ඇති බවත් කිසිදු කැඳවීමක් හෝ උත්තේජක ක්‍රියාවන් සිදුනොවන බැවින් ගම්වල පවා විශ්වාසය පළුදු වි ඇති බවත් සම්ප්‍රදායික ක්‍රමවේදයන් වලින් බැහැර වි ඔවුන්ටද අවස්ථාව ලබාදෙන ලෙසත් දන්වන ලදී.ආදායම් වැඩිකරගැනිමට සියයට එක ලබාගැනිමට නව වාාපාර පිලිබඳව තව දුරටත් සොයන ලෙසත් විදුලි සංදේශ කුළුනු,මහජන වැසිකිලි ආදායම් වැඩිකරගැනිම් බෝපත්ඇල්ල,පැරනි පුවත්පත් විකිනීම් ආදි කටයුතු පිලිබඳ සාකච්ජා විය.මන්ත්‍රී

යෝජනා ක්‍රියාත්මක කිරිමට මුදල් අළුතෙන් ලබාගැනිම අත්‍යවශ්‍ය වන වුවත් ආදායම් එන වැඩපිලිවෙලක් සභාව සතුව නැති බවත් පාරිභෝගිකයන්ට බලපැමක් සිදු නොවන බවත් උත්තේජක ක්‍රමවේද නොමැති බවත් කපා හැරිම් පමනක් බවත් අයකරගැනිම් පිලිබඳව නීතිමය

ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරිම මන්දගාමි බවත් පෙන්වා දුනි. එසේම කිරිඇල්ල, එල්ලාවල,දොඩම්පෙ උපකාර්යාල ප්‍රදේශවල අයකරගතයුතු තැන්බලා දේපොල තහනම් කර ආදායම් ලබාගැනිමට කටයුතු කරන ලෙස දැනුම් දුනි.නොමැතිනම් වියදම් දරාගත නොහැකි තත්වයක් එල බව පෙන්වා දුනි.ජනවාරි මාසයේ සිට එම කටයුතු ක්‍රියාත්මක කරන බව ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.හිග්ගස්හේන වැඩිමුදලට පැරනි පුවත්පත් මිලදිගන්නා ස්ථානයක් පවතින බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසූරිය මහතා දන්වන ලදි.
ගරු සභාපතිතුමා විසින් අදහස් දක්වමින් ඇතැම් කම්කරුවන් සේවය කල නොහැකි තත්වයේ සෞඛ්‍ය අපහසුතා ඇතිබව දන්වන හෙයින් ඒ අය වෛද්‍ය වාර්තා රැගෙන ඉවත්කිරිමට පියවර ගතයුතු බවදන්වන ලදී.නාමල්නේිය උපකාර්යාලයේ පියරත්න හා ප්‍රධාන කාර්යාලයේ දසුන් දෙදෙනා මෙසේ සේවය කිරිමට නොහැකි සෞඛ්‍ය තත්වයක සිටිද යන්න වාර්තා රැගෙන ඉදිරි මෙම මස තුලදීමකටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම්දෙන ලදී.වැඩකල හැකි තත්වයේ සිටියදී නොකිරිම ගැටළුකාරිබැවින් එය විසඳියයුතුබව දන්වන ලදි.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩිලාන් රණසිංහ මහතා විසින් අදහස් දක්වමින් දෛනික වැඩ සඳහා ඔවුන්ට වෙන්කර ප්‍රමාන කර වැඩ පැවරීම්, ඉලක්ක ලබාදිය යුතුබවත් සේවය නොකරන්නේ නම් ලිපි යොමු කර ඉදිරි ක්‍රියාමාර්ග ගතයුතුබවත් දන්වන ලදි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා විසින් අදහස් දක්වමින් ඉන්ධන මිල වැඩිවිම හේතුවෙන්හා සභාවට විශාල ඉන්ධන බිලක් එන හෙයින් අරපිරිමැස්මෙන් ඉන්ධන භාවිතකලයුතුබවත් අත්‍යවශ්‍ය කටයුතු වලට පමනක් ඉන්ධන වැය කරන ලෙසද දැනුවත් කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් අදහස් දක්වමින් නාමල්දෙනිය ගිමන්හල අසල ඉන්ධන පිරවුම්හලක් දැමීම සුදුසුබව ට යෝජනා කරන ලදී.ඒ අනුව විශාල ආදායමක් ලබාගතහැකි බවත් අයිඕසී සමග ගිවිසුම්ගතව කටයුතු කලහැකි බවත් දන්වන ලදී.කෝටි 1ක පමන මුදකල් අයවැයෙන් වෙන් කලහොත් මෙය ක්‍රියාත්මක කල හැකි බවත් දන්වන ලදි.
බලපත්‍රය ලබාගතයුතු අතර පාර අයිනේ මීටර් 75 ක් මූනත අවශ්‍ය බවත් සිපෙට්කෝ මගින් ඉදිකිරිම කරවා ලැබෙන ආදායමින් පඩි ගෙවීම් කර පවත්වා ගෙන ගියහැකි බවත් දන්වන ලදි.
ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා විසින් අදහස් දක්වමින් තෙල් පිරිමැසීම සඳහා ටැංකියක් භාවිත කලයුතුබවත් සරල උපකරනයක් මගින් එම කටයුතුත කල හැකි බවත් දැනට ඇති ගලි බවුසරය ප්‍රමානවත් බවත් දන්වන ලදී. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා අදහස්දක්වමින් 2022 වර්ෂයේ අතිරික්තයක් ලෙස ලක්ෂ 40 ක්වත් තබාගතයුතුඅතර ආපදාවකදි ප්‍රයෝනයට ගතහැකි ලෙස තබාගතයුතුබව දන්වන ලදි.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා අදහස් දක්වමින් විනෝද බදු වැඩිකිරිම තුලින්ද යම් ආදායමක් ලබාගතහැකි බව දන්වන ලදී.
මෙම අවස්ථාවේදි කාරක සබාව නැවත මහාසභාව බවට පත්කිරිම ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා ගේ හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සිදුකෙරිනි.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u> :-

අයවැය කෙටුම්පතට ඇතුලත්විය යුතු යෝජනා අදහස් රසක් සාකච්ඡා උනා.විශාල යෝජනා රසක් ක්‍රියාත්මක කලනොහැකි උවත් එම ඉහත දැක්වූ අදහස් මාර්ගෝපදේස ලෙස සලකා ක්‍රියා කරන්න. සභාවේ ආදායම් වැඩිකරීම සම්බන්ධව දැක්වූ අදහස් වැදගත්.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා</u>

සභාව සතු ඉඩම් විශේෂයෙන් පොහොරබාවකසලඅංගනය හා සුසාන භූමි  යම් ක්‍රමවේදයකට තාවකාලික වගාකිරිම්වලට ගොවින්ට ලබාදී ආදායමක් ලබාගැනිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී තරංග නිල්මිනි මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.
කුරුඳු වැවීම තුලින් විශාල ආදායමක් එකවර ලැබිය හැකියි.
<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසූරිය මහතා</u>
දීර්ග ලෙස කරුනු දැක්වූවා. සභාවේ ආදායම් ලබාගැනීමේදි මගහැරුනු කරුනු  හා අත්‍යවශ්‍ය ඒත් මගඇරුනු අංශ කෙරේ අවධානය දක්වන්න.ඉඩම්සේල් වලින් එන ආදායම්,එසේම තවමත් විසඳුම් නැති කැලි කසල ගැටළුව,තාවකාලික විසඳුම් විතරයි තවම.කුරුවිට නගරයේ පොදු වැසිකිලිය ,සුසානභූමි සම්බන්ධව කටයුතු විධිමත්කරන්න.අවම වශයෙන් ඒවා පවිත්‍ර කරඅයිතිය වත් තහවුරු කරන්න.පවරාගැනිම් සිදු කරන්න. එසේම කුරුවිට සතිපොල දිනෙන්දින පිරිස අඩු වෙනවා.පොලේ කිසිදු සංවර්ධනයක් නෑ.ගඟට බහින ස්ථානයේ වගා කරලා.ඒවා අනාගතයේ ගැටළු වෙන්න පුළුවන්.මැදිහත්වෙන්න.
අනවශ්‍ය වියදම් කපා හරින්න.සභාවක් ලෙස අපිටත් හැකියි මේ අවස්ථාවේ ආදර්ශයක් දෙන්න.අපේ දිමනා වලටත් විශාල වියදමක් යනවා.යම් ප්‍රමාණයක් අඩුකරලා ගතහැකිනම් එය ආදර්ශයක්.දිවා සුරැක්ම් මධ්‍යස්ථාන අපේ ප්‍රදේශයේ උසස් තත්වයේ ඒවා නෑ. හැකිනම් සභාවෙන්  මැදිහත්වි සිදු කිරිම වැදගත්.එසේමපුස්ථකාල වලට නව තාක්ෂනය ලබාදි ඊ පුස්ථකාල සේවයක් ක්‍රියාත්මක කිරිම වැදගත්.දැන් පිරිස පොත් කියවනවා අඩුයි.නව තාක්ෂනය ඒවාට දෙන්න.ඒ වගේමයි මේ මන්ත්‍රිවරු ලෙස අයවැයට යෝජනා දුන්නත් ප්‍රතිපාදන වෙන් කලත් හැම මන්ත්‍රීලටම දුනෑ.විදි ලාම්පු දෙනවා කීවත් දුන්නෑ.විදේශ පුහුණු වගේ අනවශ්‍ය වියදම් මේ වෙලාවේ කපා හරින්න.නාස්තිකාර වියදම්.එහෙම ගිහින් ඒ අය  පසුගිය කාලේ කලේ මොනවද?සේවක පුහුනුවීම් නෙවේ. ඵලදායිතාවක් තියෙන්න ඕනි.
මම අයවැය කෙටුම්පතට විරෝධතාව දක්වනවා.එසේම බෙදීමක් ඉල්ලනවා.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u> :-
ඔබතුමා යම්යම් යෝජනා ඉදිරිපත් කලා.ඒවාටත් විරුද්ධද?

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩිලාන් රණසිංහ මහතා</u>
ජවිපෙ සාමාන්‍ය විධිහ.ගිය සැරේත් විරුද්ධ උනා.ඒ සැරේ අයවැයට පක්ෂ අයටයි ඵලයක් ලැබුනේ.කොට්ඨාශ පදනම් කරගෙන 2023 ගෙනාවා.අපි එකඟ උනා.නමුත් මේ අයවැය විරුද්ධ අයට ප්‍රතිපාදන ඉල්ලන්න  බෑ.හැමෝම කතා වෙලා යෝජනා දිලා කුරුවිටට ගැලපෙන

අයවැයක් හදන්නේ.අපේ යෝජනායි තියෙන්නේ.සදාචාර අයිතියක් නෑ විරුද්ධ අයට ප්‍රතිපාදන ඉල්ලන්න.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා

විශාල අදහස් රසක් ඉදිරිපත් උනා.අද සභාවේ සියළු දේශපාලන පක්ෂ සිටනවා.අපි අවු4 ½ ක් තර්ක කලා.ජනතා යහපත වෙනුවෙන්.සභා උන්නතිය වෙනුවෙන් කටයුතු කලා.නමුත් විවේචනය කරන්නේ තරහින් නෙමේ.කඩාකප්පල් කරන්න නෙවේ.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

මේ වන විට රටේ අවපාත රසක්.ආර්ථික අවපාත.වසංගත.සමාජ ව්‍යවසන. ඒ මැද අපි මේ සභාවේ ජනතාව වෙනුවෙනුයි මෙතරම් කතා කරන්නේ.සමහර අවස්ථාවල අර පරිපූරක වගේ දේවලදී විරුද්ධ උනා.දේශපාලන මතවාද කෙසේ උනත් අපි එකම මතයක් වෙනුවෙන් කතා කරන්නේ.ප්‍රතිපාදන ලැබුනත් නැතත් කතාකරන්නේ ජනතාව වෙනුවෙන්.2023 අපිසභාවේ හිටියත් නොහිටියත් ජනතාව වෙනුවෙන් මේ අයවැයට කරුනු දැක්වූයේ.අදට වඩා හොඳ හෙටක් වෙනුවෙන්.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා

අයවැයට සහාය දෙනවා. අයවැය ඉදිරිපත් කල සැමවිටම අපි සහාය දුන්නා.අපි හොඳ දේට සහාය ලබාදෙන විපක්ෂයක් ලෙසයි කටයුතු කලේ.නමුත් මේ අවස්ථාවේ මා ඉල්ලා සිටින්නේ මට නැතත් විපක්ෂය ඉදිරිපත් කරන එක යෝජනාවකට හෝ අවස්ථාව දෙන්න. වීදි පහන් 10 බැගින් හෝ ලබා දෙන්න.13 දෙනා හට ජනතාවට සේවයක් සලසන්න අවස්ථාවක් දෙන්න.මට එපා.සාධාරනයක් ඉටු කරන්න.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා

ආයතනයක අයවැය ඉතා වැදගත්.ගෘහයක උවත් දේපොල, ආදායම ,මුදල් ,ආරක්ෂාව, ආයෝජනය ආදිය කලමනාකරනය කරනවා.යම් ක්‍රමවේදයක් තියෙනවා.නමුත් අපිට මේ ක්‍රමවේදය පසුගිය කාලසිමාවේ මග ඇරුනා. දේපොල බැහැර උනා,නගරයේ ඉඩම් කෙරේ අවධානය නැති උනා, රැස්කලයුතු ආදායම් ලබාගෙන නෑ,භෞතිකව වැඩ කලාට දුප්පත්වෙලා. දේපොල රැක්කෙ නෑ.දිනාගත්ත නඩුත් ආයේ වියදම් කරලා නඩු කියන්න වෙලා.පසුගිය පාලන කාලය ගැන සතුටුවෙන්න බෑ.බපාපොරොත්තු ඉලක්ක වලට ලඟාවෙන්න බැරිවෙලා.නමුත් හොඳ නිතිමය පදනමක් තුල වැඩ කරලා අපිට යහපත් ප්‍රගතියක් අත්කරගන්න තවමත් හැකියි. ගරු සභාපතිතුමා,සභාවේ දේපොල ඉඩම් වටේ මැන ඒ වැට ට කම්බි ගහලා ඒ වැඩේ කරමු. කිරිඇල්ල තියෙන ඒ විශාල ඉඩම වගා කරන්න පුළුවන්.ඉදිරියේදී රජයෙන් මුදල් දෙනවද නැත්ද? විශ්වාස නෑ.වියදම් විශාල මුදලක් යනවා නඩු වලට. ඇත්තටම මේ විධිහට නඩු වලට සභාවේ මුදල් වැය කිරිම අපරාධයක්. පනතේ නීති ක්‍රියාත්මක කරලා මුලින්ම නඩු නොයන තත්වයෙන් ඒවා විසඳා ගන්න.නීතිඥ ගාස්තු පිලිබඳව අපිට තර්ක කරන්න බෑ.නමුත් නඩු නොයා පනත අනුව කටයුතු කරලා අපිට මුදල් ඉතිරිකරගන්න පුළුවන්.විශේෂයෙන් සභාවේ කිසිදු මුදලක් අවභාවිත කිරීමෙන් වලකින්න.ඇත්තටම ආරක්ෂාවෙන්න. මේවාට විරුද්ධ වෙලා වැඩක්

නෑ.කැමතිවෙලා වැඩකුත්නෑ වගේ. සභාපතිතුමාගේ මතය අනුව වෙන්නේ.මගේ කිසිවෙකු සමග රහස් සම්බන්ධතා නෑ.පසුගිය කාලෙට වඩා හොඳ අනාගතයක් පතනවා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා
සභාවේ සියළු කරුනු දක්වන්නේ ජනතාවගේ යහපත සඳහායි.වැරදි ලෙස දකින්න එපා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා
අපි අයවැය වාද විවාද වුනා.අපිත් සහාය පල කරනවා.අපිට අවශ්‍ය උනේ ලබන වසරට යහපත් අයවැයක් ඉදිරිපත් කරන්නයි.දේවින්ද මන්ත්‍රිතුමා කීවා වගේ පක්ෂ විපක්ෂ බේදයක් නැතුව සහාය ලබාදෙනවා.රජයේ වෙනත් ආධාරත් නැතුව අපි අපහසුතා මැද අපි අවුරුදු 4ක් උපරිම වැඩකලා.විදිපහන් දැම්මා අපිට විදුලි බලාගාර වලින් නීත්‍යානුකූලවආදායම් ලබාගත හැකියි.මේ ගැන ඉදිරි කටයුතු කරන්න.සහාය දෙනවා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා
ශ්‍රිලනිප අය අද නෑ.එජාපයේ අපි සහාය දෙනවා.ඉදිරියේ කුමක් වෙයිද දන්නෑ.නමුත් ලබන අයවැය සම්මත කරලා යායුතුයි.උපසභාපතිතුමා,මංගල මන්ත්‍රි,ජයරත්න මන්ත්‍රී අයවැය පිලිබඳ කරුනු රැසක් දැක්වුවා.මුදල් ගැන හිතුවේ නෑ.සහාය දුන්නා.2018 සිට මටත් ප්‍රතිපාදන ලැබී නෑ.ප්‍රෙද්ශයට ගරු ධනංජය මන්ත්‍රිතුමත් උනන්දුවෙන් සේවය කරනවා.කොවිඩ්,දේශපාලන අස්ථාවරභාවය නිසා බොහෝ දේ මගඇරුනා.ලබන මාර්තු 20 වගේ කාලයක් අපිට තියෙන්නේ ඒ කාලය තුල දී හෝ විපක්ෂයටත් අවස්ථා. සහාය දෙන්න.ඉතා අබලන් මාර්ග හදන්න.විශාල බල ප්‍රදේශ තියෙන ප්‍රාදේශිය සභා නගර සභා බවට පත් කරනවාළු. හැකිනම් ඒකත් කරන්න.
එහෙම කලොත් අපිට මේ කාලේ පරිවර්තනයක් උනා කියලා සතුටු වෙන්නත් පුළුවන්.අයවැයට පක්ෂයි.සහාය දෙනවා.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-**

2023 වර්ෂයට අයවැය සංශෝධන ඉදිරිපත් කලා.නව යෝජනාත් තිබුනා.හැමෝටම පිලිගතහැකි.සභාව වසරක් දීර්ඝ කලත් කොයි වෙලේ විසුරුවයිද දන්නෑ.ජයරත්න මන්ත්‍රිතුමා හිතුවිදිහ වැරදියි. ප්‍රතිපාදන අඩු වැඩි අය ඇති.නමුත් ඒ පුද්ගලික පක්ෂග්‍රාහී වීමක් වැනි කරුනු මත නෙවේ.ඒ ඉල්ලීම් ප්‍රතිපාදන ලැබුනොත් කරමු.අයවැයේ කෙටුම්පතේ සඳහන් යෝජනා වලට අමතරව අදදින සභාවේ සාකච්ජාවූ විශේෂ කරුනු අතරින් සභා බල ප්‍රදේශයේ ස්තිර දැන්වීම් පුවරුවකට වර්ගඅඩියට රු.150.00 බැගින් අයකිරිම,නාමල්දෙනිය ගිමන්හලේ වාස්තුබැලිම සිදු කිරිමටත් එසේම සභාබල ප්‍රදේශයේ සුසාන භූමි වටා කම්බිවැටගැසීම කටයුතුසඳහා රු. 20 00000.00 ක්යෙදවීම,නාමල්දෙනිය ගිමන්හල අසල ඉන්ධන පිරවුම්හලක් සඳහා කෝටි 01ක් යෙදවිම,කුරුවිට මහජන වැසිකිලිය සංවර්ධනය සඳහා ලක්ෂ 40ක් යෙදවිම,දැන්විම්පුවරු වලින් ආදායම ලෙස ලක්ෂ 01ක් වැඩිපුර එකතුකිරිම වැනි යෝජනා අළුතින් එකතුකර සංශෝධනය කරමු.ගරු මන්ත්‍රිතුමන්ලා විෂය වෙත මේවනවිටත් වෙනත් යෝජනාත් ලබාදී තියෙනවා.අදදින සභාවේ සාකච්ජා වු කරුනුවලින් මෙම අළුතෙන් මෙමසංශෝධන එක්කරමු.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසූරිය මහතා අයවැය වෙනුවෙන් බොහෝ අදහස් දක්වා අන්තිමේදීතම පක්ෂයේ ප්‍රතිපත්තිය අනුව විරෝධතාවය පල කලා.එසේම එතුමා 2023 අයවැයට විරුද්ධ අතර බෙදීමක් ඉල්ලුවා.ඒ අනුව මෙම අවස්ථාවේදි බෙදිමකට යමු.ප්‍රථමයෙන්

**කුරුවිට ප්‍රාදේශීය සභාවේ2023 වර්ෂයේ අයවැය කෙටුම්පත සඳහා සංශෝධනයන්ට යටත්ව අනුමැතිය ලබාදීමට කැමති, පක්ෂ ගරු මන්ත්‍රිතුමන්ලා තුමියන්ලා අත්ඔසවා මතය පල කරන්න. පසුව අයවැය කෙටුම්පතට විරුද්ධ ගරු මන්ත්‍රිතුමන්ලා තුමියන්ලා අත්ඔසවා මතය පල කරන්න.**

ඒ අනුව මෙම අවස්ථාවේ මෙදින විශේෂ මහා සභාව සඳහා ගරු මන්ත්‍රී තුමන්ලා තුමියන්ලා 28 දෙනෙකු සහභාගී වී සිටි අතර ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා, ගරු උපසභාපති ඒ.ජේ.අනිල් ලියනගේ මහතා ,ගරු ප්‍රාසම ප්‍රේමා ගම්ලත් මිය,*ගරු ප්‍රාසම ජී.ඒ.ජයසිංහ මහතා,ගරු ප්‍රාසම ආර් .සෝමරත්න මහතා, ගරු ප්‍රාසම ඩබ්..විකසිත පුෂ්පසූරිය මහතා* ,ගරු ප්‍රාසම එස්.ඒ.මහින්ද විජේකුමාර මහතා,ගරු ප්‍රාසම එච්.එම්.සී.එස්.ධනවර්ධන මහතා ගරු ප්‍රාසම එම්.කේ. විජේසිරි මහතා ,ගරු ප්‍රාසම ජී.එම්. ජයරත්න ,මහතා,ගරු ප්‍රාසම පී.පී.තරංග නිල්මිණි මහතා ,ගරු ප්‍රාසම පී.ඩබ්.එස්.සම්පත් බොතේජු මහතා ,ගරු ප්‍රාසමකේ.ඒ.අසංක දිල්ෂාන් මහතා,ගරු ප්‍රාසම කැළුම් ශ්‍රී ධර්මදාස මහතා , ගරු ප්‍රාසම පී.දීප්ති චන්දන විජේසිරි මහතා , ගරු ප්‍රාසම මාලනී පීරිස් මිය ,ගරු ප්‍රාසම ජීවන් රණතුංගමහතා, ගරු ප්‍රාසම ඩබ්.එම්.මදුෂාණි වීරසිංහ මිය ,ගරු ප්‍රාසම ඉන්ද්‍රානි වික්‍රමසිංහ මිය, ගරු ප්‍රාසම චන්ද්‍රලතා බණ්ඩාර මිය,ගරු ප්‍රාසම මංගල කිත්සිරි ඩයස් මහතා,ගරු ප්‍රාසම කේ.එල්.එම්.ඩී.කරදන මිය ,ගරු ප්‍රාසම රුවන් අශෝක පතිරණ මහතා ,ගරු ප්‍රාසම ආර්.ඩිලාන් දර්ශන රණසිංහ මහතා ,ගරු ප්‍රාසම ජී.ඩබ්.ජනක විමලසිරි මහතා ,ගරු ප්‍රාසම එම්.ජී.ධනංජය වීරසේකර මහතා ,ගරු ප්‍රාසම එම්.ඒ.දේවින්ද කුමාර මහතා,ගරු ප්‍රාසම ජී.ර්.ඒ.රනිල් එදිරිසිංහ මහතා යන පිරිස සහභාගි වි සිටි පිරිස වූහ.මෙදින විශේෂ සභාවට **සහභාගි නොවු පිරිස 17ක් වුහ.එම 17 දෙනා අතර** ගරු මන්ත්‍රී එස්.රත්නසිරි මහතා,ගරු මන්ත්‍රී බී.ජී. ජීවන් අබේවික්‍රමපාල මහතා,ගරු මන්ත්‍රී කේ.කේ.දයා කස්තුරි මහත්මිය, ගරු මන්ත්‍රී ශානක දර්ශන චතුරංග මහතා,ගරු මන්ත්‍රී එස්.එච්.අසංක එරන්ද මහතා,ගරු මන්ත්‍රී ඩී. රවීන් විනෝද් මහතා,ගරු මන්ත්‍රී පී.කේ.ලක්මාල් රුවන් කුමාර මහතා,ගරු මන්ත්‍රී අයි.කේ.කුලරත්න මහතා ,ගරු මන්ත්‍රී එච්.විමල්සිරි ජයලත් මහතා.ගරු මන්ත්‍රී අයි.කේ.රන්ජන් ප්‍රදීප් මහතා ,ගරු මන්ත්‍රී එල්.කේ.ජී.යසසිරි ප්‍රභාත් ජයසූරිය මහතා,ගරු මන්ත්‍රී ඒ. නයනා ජීවනි අතුකෝරල මහතා ගරු මන්ත්‍රී බී.ආර්.ඒ. මුදිතා ශ්‍රිමතී සෝමරත්න මහත්මිය,ගරු මන්ත්‍රී එම්.පී.ආර්.මදුසංඛ දේශප්‍රිය මහතා.ගරු මන්ත්‍රී ඒ.පී. චන්දිම යුරේශ් පතිරණ මහතා,ගරු මන්ත්‍රී එස්.ඩබ්. රංජිත් මැන්දිස් මහතා ගරු මන්ත්‍රී ඩබ්.කේ.තිලකාවතී මහත්මිය යන පිරිස වුහ.මෙදින සහභාගි වු 28 දෙනාගෙන් *ගරු ප්‍රාසම එම්.ඩබ්.විකසිත පුෂ්පසූරිය මහතා පමනක් අයවැයට විපක්ෂව අත ඔසවා විරෝධය පලකල අතර* අනෙක් 27 දෙනා අයවැයට පක්ෂව අත ඔසවා කැමැත්ත පලකලහ.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-</u>

ඒ අනුව මුළු ජන්ද 28 න් බහුතර ජන්ද 27 කින් **කුරුවිට ප්‍රාදේශීය සභාවේ2023 වර්ෂයේ අයවැය කෙටුම්පත සඳහා සංශෝධනයන්ට යටත්ව අනුමැතිය ලබාදීමට විශේෂ මහා සභා එකඟතාවය ලැබුණා.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව විශේෂ මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxx**

ගරු _ප්‍රාදේශිය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසූරිය මහතා 2023 අයවැයට විරුද්ධ අතර බෙදීමක් ඉල්ලා සිටිබැවින් ගරු සභාපතිතුමාගේ දැනුම්දීමෙන් බෙදිමකට අවස්ථාව ලබාදුන් අතර

.ප්‍රථමයෙන් **කුරුවිට ප්‍රාදේශීය සභාවේ2023 වර්ෂයේ අයවැය කෙටුම්පත සඳහා සංශෝධනයන්ට යටත්ව අනුමැතිය ලබාදීමට කැමති, පක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා අත්ඔසවා මතය පල කිරිමත් පසුව අයවැය කෙටුම්පතට විරුද්ධ ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා අත්ඔසවා මතය පල කිරිමත් සිදුවිය.**

ඒ අනුව මෙම අවස්ථාවේ මෙදින විශේෂ මහා සභාව සඳහා ගරු මන්ත්‍රී තුමන්ලා තුමියන්ලා 28 දෙනෙකු සහභාගී වී සිටි අතර ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා, ගරු උපසභාපති ඒ.ජේ.අනිල් ලියනගේ මහතා ,ගරු ප්‍රාසම ප්‍රේමා ගම්ලත් මිය,*ගරු ප්‍රාසම ජී.ඒ.ජයසිංහ මහතා,ගරු ප්‍රාසම ආර් .සෝමරත්න මහතා, ගරු ප්‍රාසම ඩබ්..විකසිත පුෂ්පසූරිය මහතා* ,ගරු ප්‍රාසම එස්.ඒ.මහින්ද විජේකුමාර මහතා,ගරු ප්‍රාසම එච්.එම්.සී.එස්.ධනවර්ධන මහතා ගරු ප්‍රාසම එම්.කේ. විජේසිරි මහතා ,ගරු ප්‍රාසම ජී.එම්. ජයරත්න ,මහතා,ගරු ප්‍රාසම පී.පී.තරංග නිල්මිණි මහතා ,ගරු ප්‍රාසම පී.ඩබ්.එස්.සම්පත් බොතේජු මහතා ,ගරු ප්‍රාසමකේ.ඒ.අසංක දිල්ෂාන් මහතා,ගරු ප්‍රාසම කැළුම් ශ්‍රී ධර්මදාස මහතා , ගරු ප්‍රාසම පී.දීප්ති චන්දන විජේසිරි මහතා , ගරු ප්‍රාසම මාලනී පීරිස් මිය ,ගරු ප්‍රාසම ජීවන් රණතුංගමහතා, ගරු ප්‍රාසම ඩබ්.එම්.මදුෂාණි වීරසිංහ මිය ,ගරු ප්‍රාසම ඉන්ද්‍රානි වික්‍රමසිංහ මිය, ගරු ප්‍රාසම චන්ද්‍රලතා බණ්ඩාර මිය,ගරු ප්‍රාසම මංගල කිත්සිරි ඩයස් මහතා,ගරු ප්‍රාසම කේ.එල්.එම්.ඩී.කරදන මිය ,ගරු ප්‍රාසම රුවන් අශෝක පතිරණ මහතා ,ගරු ප්‍රාසම ආර්.ඩිලාන් දර්ශන රණසිංහ මහතා ,ගරු ප්‍රාසම ජී.ඩබ්.ජනක විමලසිරි මහතා ,ගරු ප්‍රාසම එම්.ජී.ධනංජය වීරසේකර මහතා ,ගරු ප්‍රාසම එම්.ඒ.දේවින්ද කුමාර මහතා,ගරු ප්‍රාසම ජී.ඊ.ඒ.රනිල් එදිරිසිංහ මහතා යන පිරිස සහභාගි වි සිටි පිරිස වූහ.මෙදින විශේෂ සභාවට **සහභාගි නොවූ පිරිස 17ක් වූහ.එම 17 දෙනා අතර** ගරු මන්ත්‍රී එස්.රත්නසිරි මහතා,ගරු මන්ත්‍රී බී.ජී. ජීවන් අබේවික්‍රමපාල මහතා,ගරු මන්ත්‍රී කේ.කේ.දයා කස්තුරි මහත්මිය, ගරු මන්ත්‍රී ශානක දර්ශන චතුරංග මහතා,ගරු මන්ත්‍රී එස්.එච්.අසංක එරන්ද මහතා,ගරු මන්ත්‍රී ඩී. රවීන් විනෝද් මහතා,ගරු මන්ත්‍රී පී.කේ.ලක්මාල් රුවන් කුමාර මහතා,ගරු මන්ත්‍රී අයි.කේ.කුලරත්න මහතා ,ගරු මන්ත්‍රී එච්.විමල්සිරි ජයලත් මහතා.ගරු මන්ත්‍රී අයි.කේ.රන්ජන් ප්‍රදීප් මහතා ,ගරු මන්ත්‍රී එල්.කේ.ජී.යසසිරි ප්‍රභාත් ජයසූරිය මහතා,ගරු මන්ත්‍රී ඒ. නයනා ජීවනි අතුකෝරල මහතා ගරු මන්ත්‍රී බී.ආර්.ඒ. මුදිතා ශ්‍රිමතී සෝමරත්න මහත්මිය,ගරු මන්ත්‍රී එම්.පී.ආර්.මදුසංඛ දේශප්‍රිය මහතා.ගරු මන්ත්‍රී ඒ.පී. චන්දිම යුරේශ් පතිරණ මහතා,ගරු මන්ත්‍රී එස්.ඩබ්. රංජිත් මැන්දිස් මහතා ගරු මන්ත්‍රී ඩබ්.කේ.තිලකාවතී මහත්මිය යන පිරිස වූහ.මෙදින සහභාගි වූ 28 දෙනාගෙන් *ගරු ප්‍රාසම එම්.ඩබ්.විකසිත පුෂ්පසූරිය මහතා පමනක් අයවැයට විපක්ෂව අත ඔසවා විරෝධය පලකල අතර* අනෙක් 27 දෙනා අයවැයට පක්ෂව අත ඔසවා කැමැත්ත පලකලහ.

ඒ අනුව මුළු ජන්ද 28 න් බහුතර ජන්ද 27 කින් **කුරුවිට ප්‍රාදේශීය සභාවේ2023 වර්ෂයේ අයවැය කෙටුම්පත සඳහා සංශෝධනයන්ට යටත්ව අනුමැතිය ලබාදීමට විශේෂ මහා සභා එකඟතාවය ලැබුණු අතර** 2023 අයවැයට සංශෝධන ලෙස බල ප්‍රදේශයේ ස්ථිර දැන්වීම් පුවරුවකට වර්ගඅඩියට රු.150.00 බැගින් අයකිරිම,නාමල්දෙනිය ගිමන්හලේ වාස්තුබැලිම සිදු කිරිමටත් එසේම සභාබල ප්‍රදේශයේ සුසාන භුමි වටා කම්බිවැටගැසීම කටයුතුසඳහා රු. 20 00000.00 ක්යෙදවීම,නාමල්දෙනිය ගිමන්හල අසල ඉන්ධන පිරවුම්හලක් සඳහා කෝටි 01ක් යෙදවිම,කුරුවිට මහජන වැසිකිලිය සංවර්ධනය සඳහා ලක්ෂ 40ක් යෙදවිම,දැන්විම්පුවරු වලින් ලැබෙන ආදායම ලෙස ලක්ෂ 01ක් වැඩිපුර එකතුකිරිම **යන** සංශෝධනයන්ට යටත්ව විශේෂ මහා සභා අනුමැතිය ලබා දීමට ඒකමතිකව සභා සම්මත විය. **Xxxxxxxxxxxxxxx**

<u>**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-**</u>

මෙදින න්‍යාය පත්‍රයේ සූර්ය විදුලි බල පද්ධතිය පිලිබඳ යෝජනාව අද දින සාකච්ඡාවට ගනු නොලබන අතර අවශ්‍ය සියළු වාර්තා රැගෙන ඉදිරි සභාවට ඉදිරිපත් කිරිමට නියමිතයි.

- **ස්තූතිය.**

අදද දින විශේෂ සභාව ට සහභාගි වි සහාය දුන් සැමට ස්තූතිය පල කරමු.විශේෂ සභා කටයුතු අවසන් කරමි.
විශේෂ මහ සභාවේ කටයුතු ප.ව.1.00 ට පමණ අවසන් කරන ලදී.

ප්‍රේමරත්න මල්කැකුළ
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

පිටපත් : -

01.කුරුවිට ප්‍රාදේශීය සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලා වෙතට - (දැ.ගැ.පි)
02.පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා - (දැ.ගැ.පි)
03.විගණකාධිපති,විගණකාධිපති උපකාර්යාලය,මහ නගර සභාව,රත්නපුර - (දැ.ගැ.පි)
04.ප්‍රධාන කාර්යාලයේ සියලුම වැඩසටහන් සහකාරවරුන්,සංවර්ධන නිළධාරීන්, කළමණාකාර සහකාරවරුන් හා කාර්මික නිලධාරීන් වෙතට - ඔබ විෂයට අදාල කටයුතු කිරීමට
05.කාර්ය භාර නිලධාරීන් - එල්ලාවල, කිරිඇල්ල, දොඩම්පේ - ඔබ කාර්යාලයට අදාල කරුණ ගැන අවධානය යොමු කිරීමට

06.ප්‍රජා සංවර්ධන නිලධාරී - (දැ.ගැ.පි)

පැමිණීම - මෙදින රැස්වීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රිතුමන්ලා සහ ගරු මන්ත්‍රිතුමියන්ලා සහභාගි විය.

| අනු.අ තනතුර | පක්ෂය | නම | පැමිණීම |
|---|---|---|---|
| 29. ගරු සභාපති | ශ්‍රී.ල.පො.පෙ | ප්‍රේමරත්න මල්කැකුල මහතා | පෙ.ව. 09.00 |
| 30. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ප්‍රේමා ගම්ලත් මිය | පෙ.ව. 09.05 |
| 31. ගරු ප්‍රාසම | ජ.වි.පෙ | ජී.ඒ.ජයසිංහ මහතා | පෙ.ව. 09.40 |
| 32. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ආර් .සෝමරත්න මහතා | පෙ.ව. 09.59 |
| 33. ගරු ප්‍රාසම | ජ.වි.පෙ | එම්.ඩබ්.විකසිත පුෂ්පසූරිය මහතා | පෙ.ව. 09.59 |
| 34. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.ඒ.මහින්ද විජේකුමාර මහතා | පෙ.ව. 09.59 |
| 35. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එච්.එම්.සී.එස්.ධනවර්ධන මහතා | පෙ.ව. 09.59 |
| 36. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එම්.කේ. විජේසිරි මහතා | පෙ.ව. 10.00 |
| 37. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ජී.එම්. ජයරත්න මහතා | පෙ.ව. 10.00 |
| 38. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.පී.තරංග නිල්මිණි මහතා | පෙ.ව. 10.10 |
| 39. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.ඩබ්.එස්.සම්පත් බොතේජු මහතා | පෙ.ව. 10.10 |
| 40. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කේ.ඒ.අසංක දිල්ෂාන් මහතා | පෙ.ව. 10.10 |
| 41. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කැළුම් ශ්‍රී ධර්මදාස මහතා | පෙ.ව. 10.10 |
| 42. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.දීප්ති චන්දන විජේසිරි මහතා | පෙ.ව. 10.10 |
| 43. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | මාලනී පීරිස් මිය | පෙ.ව. 10.10 |
| 44. ගරු ප්‍රාසම | ශ්‍රී .ල.පො.පෙ | ජීවන් රණතුංගමහතා | පෙ.ව. 10.10 |
| 45. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ඩබ්.එම්.මදූෂාණි වීරසිංහ මිය | පෙ.ව. 10.10 |
| 46. ගරු ප්‍රාසම | එ.ජා.ප | ඉන්ද්‍රානි වික්‍රමසිංහ | පෙ.ව. 10.10 |
| 47. ගරු ප්‍රාසම | එ.ජා.ප | චන්ද්‍රලතා බණ්ඩාර මිය | පෙ.ව. 10.15 |
| 48. ගරු උපසභාපති | ශ්‍රී.ල.පො.පෙ | ඒ.ජේ.අනිල් ලියනගේ මහතා | පෙ.ව. 10.20 |
| 49. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | මංගල කිත්සිරි ඩයස් මහතා | පෙ.ව. 10.21 |
| 50. ගරු ප්‍රාසම | එ.ජා.ප. | කේ.එල්.එම්.ඩී.කරඳන මිය | පෙ.ව. 10.21 |
| 51. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | රුවන් අශෝක පතිරණ මහතා | පෙ.ව. 10.21 |
| 52. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ආර්.ඩිලාන් දර්ශන රණසිංහ මහතා | පෙ.ව. 10.45 |
| 53. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ජී.ඩබ්.ජනක විමලසිරි මහතා | පෙ.ව. 10.50 |
| 54. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එම්.ජී.ධනංජය වීරසේකර මහතා | පෙ.ව. 10.51 |
| 55. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එම්.ඒ.දේවින්ද කුමාර මහතා | පෙ.ව. 10.52 |
| 56. ගරු ප්‍රාසම | එ.ජා.ප. | ජී.ර්.ඒ.රනිල් එදිරිසිංහ මහතා | පෙ.ව. 11.50 |